සැ. යු. - 2013.01.18 වැනි දින පළවූ අංක 1,794 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,795 - 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 58 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 60 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 61 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 පෙබරවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 21

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්ථිර බලසේනාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ජ්‍යෝෂ්ඨතාවය

1. පහත නම සඳහන් නිලධාරීන් 2002 අගෝස්තු මස 06 වැනි දින සිට පහත දක්වා ඇති පිළිවෙලට අනුව ජ්‍යෝෂ්ඨතාවයෙහි තබා ඇත.

(අ) දෙවෙනි ලුතිතන් අලවත්ත කංකානම්ගේ නිලෝෂි ශානිකා කුමාරසිරි -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(ආ) දෙවෙනි ලුතිතන් පටබැඳිගේ අනුෂා සිතාරා කුරේ -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(ඇ) දෙවෙනි ලුතිතන් කරුණාකලගේ දිලංග සඳුමල් ලංකාතිලක - ඉංජිනේරු සේවා බලකාය ;
(ඈ) දෙවෙනි ලුතිතන් මාරවිල දේවගේ සම්පත් උදය කුමාර වීරසිංහ - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය ;
(ඉ) දෙවෙනි ලුතිතන් හෙට්ටිආරච්චිගේ නෙල්සන් නුවන් කුමාර- සන්නද්ධ හමුදා බුද්ධි බලකාය ;
(ඊ) දෙවෙනි ලුතිතන් කලුගමගේ චන්දන කුමාර ජයසිංහ-ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය ;
(උ) දෙවෙනි ලුතිතන් ඩොම්ගුහේවගේ සංජීව ලක්ෂ්මන් කුමාරසිරි- ශ්‍රී ලංකා සංඥා බලකාය ;
(ඌ) දෙවෙනි ලුතිතන් ශාලිකා නදීෂානි හෙට්ටිආරච්චි-සන්නද්ධ හමුදා බුද්ධි බලකාය ;
(එ) දෙවෙනි ලුතිතන් දසනායක මුදියන්සේලාගේ ජානක අජිත් දසනායක-ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
(ඒ) දෙවෙනි ලුතිතන් නුගගහ ගෙදර ජානක ප්‍රසන්න තිලකරත්න- ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය ;
(ඔ) දෙවෙනි ලුතිතන් කොඩිකාරගේ විරාජ් අසංක කොඩිකාර - ශ්‍රී ලංකා සංඥා බලකාය ;
(ඕ) දෙවෙනි ලුතිතන් කරුණාදාස දෙල්විටගේ සංජය නන්දියසේන - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ;
(ක) දෙවෙනි ලුතිතන් අමරසිංහ ලේකම්ගේ මහීෂා නිල්මිණි අමරසිංහ-සන්නද්ධ හමුදා බුද්ධි බලකාය ;
(ග) දෙවෙනි ලුතිතන් සනත් කුමාර දනවල විතානගේ - ගැමුණු හේවා බලඇණිය ;
(ච) දෙවෙනි ලුතිතන් මලවි ආරච්චි කංකානම්ගේ රුවන් කුමාර අබේවික්‍රමසිංහ-ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව ;
(ජ) දෙවෙනි ලුතිතන් සේනානායක පතිරන්නැහෙලාගේ ඉසුරු හසරංග සේනානායක-ගැමුණු හේවා බලඇණිය ;
(ට) දෙවෙනි ලුතිතන් සායක්කාර වෙදමිස්ත්‍රිලාගේ සනත් දීපාල් - ගැමුණු හේවා බලඇණිය ;
(ඩ) දෙවෙනි ලුතිතන් බලපිටිය ලියනගේ දිලාන් ඉන්ද්‍රජිත් සිල්වා-ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව ;
(ණ) දෙවෙනි ලුතිතන් විජයලත් ආරච්චිගේ සංජය ජයවර්ධන - විජයබාහු පාබල රෙජිමේන්තුව ;
(ත) දෙවෙනි ලුතිතන් පතිරණගේ හේමචන්ද්‍ර සුබෝධ කරුණාරත්න- ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය ;
(ද) දෙවෙනි ලුතිතන් මළල ආලෝක බණ්ඩාරලාගේ මහින්ද කුමාර බණ්ඩාර-ගැමුණු හේවා බලඇණිය ;
(න) දෙවෙනි ලුතිතන් වේරගොඩ ගමගේ දොන් රාගේශ්‍රී වේරගොඩ- ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(ප) දෙවෙනි ලුතිතන් රාජසිංහ දුරයලාගේ දමිත් සාගර-විජයබාහු පාබල රෙජිමේන්තුව ;
(බ) දෙවෙනි ලුතිතන් ලියනගේ දොන් චන්දන කුමාර -ගජබා රෙජිමේන්තුව ;
(ම) දෙවෙනි ලුතිතන් ඉලංගකෝන් පතිරන්නැහැලාගේ තුෂාර සංජීව-විජයබාහු පාබල රෙජිමේන්තුව ;
(ය) දෙවෙනි ලුතිතන් තරංග කුමාර ඒකනායක මඩවල-ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
(ර) දෙවෙනි ලුතිතන් තෙලිසිංහ මුදියන්සේලාගේ අමිත් චානක තෙලිසිංහ-ගජබා රෙජිමේන්තුව ;
(ල) දෙවෙනි ලුතිතන් මරියදාස් මෙරින්සන් ලලිත් කුමාර -විජයබාහු පාබල රෙජිමේන්තුව ;
(ව) දෙවෙනි ලුතිතන් රාජනායක මුදියන්සේලාගේ ජගත් කුමාර රාජනායක-කමාන්ඩෝ රෙජිමේන්තුව (ගජබා රෙජිමේන්තුව) ;
(ස) දෙවෙනි ලුතිතන් මුදිත මාධව කලුආරච්චි-ශ්‍රී ලංකා සංඥා බලකාය ;
(හ) දෙවෙනි ලුතිතන් මනිමෙල් වඩු උෂාන් සත්‍යජිත් -ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
(ළ) දෙවෙනි ලුතිතන් මාරසිංහ මුදියන්සේලාගේ චින්තක ගීත් මාරසිංහ-ගජබා රෙජිමේන්තුව ;
(අඅ) දෙවෙනි ලුතිතන් සෝලංග ආරච්චිගේ දොන් අරුණ ඉන්දික සෝලංගආරච්චි-ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
(අආ) දෙවෙනි ලුතිතන් එරමුදුගොල්ල වලව්වේ හර්ෂප්‍රිය සුරංග එරමුදුගොල්ල -ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් හේවා බලකාය ;
(අඇ) දෙවෙනි ලුතිතන් අම්පාගොඩ කුසුම්සිරි ලියනගේ -ශ්‍රී ලංකා පාබල හමුදාව ;
(අඈ) දෙවෙනි ලුතිතන් උඩුගම කෝරළලාගේ දොන් කමල් ප්‍රියන්ත පෙරේරා - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ;
(අඉ) දෙවෙනි ලුතිතන් නිලංක ප්‍රසාන් මුණසිංහ-ගජබා රෙජිමේන්තුව ;
(අඊ) දෙවෙනි ලුතිතන් කොටවිල විතානගේ සුජිත් සංජය විතානගේ -ශ්‍රී ලංකා පාබල හමුදාව ;
(අඋ) දෙවෙනි ලුතිතන් හෙට්ටිආරච්චිගේ පවිත්‍රා චිත්‍රාංගනී හෙට්ටිආරච්චි -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අඌ) දෙවෙනි ලුතිතන් වෙදගෙදර නිහාල් වෙත්තසිංහ-ගජබා රෙජිමේන්තුව ;
(අඑ) දෙවෙනි ලුතිතන් සේනානායක මුදියන්සේලාගේ අමිල ඉන්දික සේනානායක-ගජබා රෙජිමේන්තුව ;
(අඒ) දෙවෙනි ලුතිතන් දොරකේ ගමගේ තිළිණ ලසන්ත-ගැමුණු හේවා බලඇණිය ;
(අඔ) දෙවෙනි ලුතිතන් රණවීර ආරච්චිලාගේ චාමර ඉන්දික රණවීර - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අඕ) දෙවෙනි ලුතිතන් රන්කොත් ගෙදර සමන්ත පුෂ්පකුමාර රාජපක්ෂ -විජයබාහු පාබල රෙජිමේන්තුව ;
(අක) දෙවෙනි ලුතිතන් මාතර කංකානම්ගේ රුක්මන් බණ්ඩාර-ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
(අග) දෙවෙනි ලුතිතන් රත්නායක මුදියන්සේලාගේ එනිකා ලිලානි මැණිකේ සෙනෙවිරත්න-සන්නද්ධ හමුදා බුද්ධි බලකාය ;
(අච) දෙවෙනි ලුතිතන් මොරඋල ලේකම්ලාගේ අනෝමා පුෂ්පලතා ලේකම්ගේ -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අජ) දෙවෙනි ලුතිතන් කලුවාහන්දි දිසාන්ති මෙන්ඩිස් -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අට) දෙවෙනි ලුතිතන් වඩුමේස්ත්‍රිගේ ඉනෝකා ප්‍රියංගනී -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අඩ) දෙවෙනි ලුතිතන් හේරත් මුදියන්සේලාගේ මාලක මිහිර බණ්ඩාර සෙනෙවිරත්න -කමාන්ඩෝ රෙජිමේන්තුව (ගැමුණු හේවා බලඇණිය) ;
(අණ) දෙවෙනි ලුතිතන් ඉලන්දාරි දේවගේ චතුරි නිසන්සලා ගුණරත්න -සන්නද්ධ හමුදා බුද්ධි බලකාය ;
(අත) දෙවෙනි ලුතිතන් විතාන පතිරණනැහැලාගේ ෂයනි වත්සලා රාමනායක -ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය ;
(අද) දෙවෙනි ලුතිතන් දිසානායකලාගේ ෂෙරෝන් මහින්ද දිසානායක -ගජබා රෙජිමේන්තුව ;
(අන) දෙවෙනි ලුතිතන් රංගන ශ්‍රී ලලින්ද බෝදරගම-ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;

(අප) දෙවෙනි ලුතිතන් සමරකෝන් ජයසුන්දර මුදියන්සේලාගේ එරන්ද චමිත් ධනපාල-ඉංජිනේරු සේවා බලකාය ;

(අබ) දෙවෙනි ලුතිතන් කුඩාරාලලාගේ නුවන් වාසනා බංඩාර -ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;

(අම) දෙවෙනි ලුතිතන් පනන්ගම රාලලාගේ නිස්සංක විජිත කුමාර පනන්ගම -ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;

(අය) දෙවෙනි ලුතිතන් ඉන්දික රුවන් කැලුම් කුමාර සිවනෙත්ති -ශ්‍රී ලංකා පාබල හමුදාව ;

(අර) දෙවෙනි ලුතිතන් ජයසුන්දර මුදියන්සේලාගේ අසෝක බණ්ඩාර ජයසුන්දර -ගැමුණු හේවා බලඇණිය ;

(අල) දෙවෙනි ලුතිතන් ගයාන් සම්පත් පාඩිගමගේ -ශ්‍රී ලංකා පාබල හමුදාව ;

(අව) දෙවෙනි ලුතිතන් මානවඩුගේ අමරසිරි මානවඩුගේ -ශ්‍රී ලංකා පාබල හමුදාව.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

01-720

---

2013 අංක 22

DIRF/RECT/235/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ජ්‍යෙෂ්ඨතාවය

පහත නම් සඳහන් නිලධාරීන් 2005.10.05 වැනි දින සිට පහත දක්වා ඇති පිළිවෙල අනුව ජ්‍යෙෂ්ඨතාවයෙහි තබා ඇත.

(අ) දෙවන ලුතිතන් කිෂානි නිරෝෂා අබේවික්‍රම - ශ්‍රී ලංකා කාන්තා බලකාය ;

(ආ) දෙවන ලුතිතන් කාන්ගර මුදියන්සේලාගේ තිළිණ රන්ධික උලපනේ - ශ්‍රී ලංකා යුධෝපකරණ බලකාය ;

(ඇ) දෙවන ලුතිතන් උඩුවනගේ එරංග රේණුක මුණසිංහ - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(ඈ) දෙවන ලුතිතන් පහළගෙදර ආනන්ද සම්පත් ජයසේන - ශ්‍රී ලංකා පාබල හමුදාව ;

(ඉ) දෙවන ලුතිතන් මුරුක්වාදුර අසේල මෙන්ඩිස් - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(ඊ) දෙවන ලුතිතන් රණතුංග මුදියන්සේලාගේ කසුන් තරංග රණතුංග - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(උ) දෙවන ලුතිතන් ගයනි මධුරිකා බෝදරගම - ශ්‍රී ලංකා කාන්තා බලකාය ;

(ඌ) දෙවන ලුතිතන් කැලුම් චමින්ද බණ්ඩාර විජේකෝන් - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;

(එ) දෙවන ලුතිතන් හේරත් රාජකරුණා අතපත්තු වාසල මුදියන්සේලාගේ ඉෂාර අකලංක නියන්ගොඩ - සන්නද්ධ බුද්ධි බලකාය ;

(ඒ) දෙවන ලුතිතන් ගයනාත් එරංග අලුත්වීදිය කෝරාල - කමාන්ඩො රෙජිමේන්තුව ;

(ඔ) දෙවන ලුතිතන් රැත්තේපිටියේ ගෙදර සුමුදු සම්පත් කුමාර ප්‍රේමරත්න - ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකාය ;

(ඕ) දෙවන ලුතිතන් තෙන්නකෝන් මුදියන්සේලාගේ වසන්ත බණ්ඩාර කරුණාරත්න - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(ක) දෙවන ලුතිතන් කුරුකුලසූරිය පටබැඳිගේ කුෂාන් මධුෂංක ප්‍රනාන්දු - ශ්‍රී ලංකා සංඥා බලකාය ;

(ග) දෙවන ලුතිතන් ලියනගේ තුෂාර අනුර ලියනගේ - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;

(ච) දෙවන ලුතිතන් බඩල් මුහන්දිරම්ලෑ ගෙදර ශ්‍යාමින්ද සෝමනාථ - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(ජ) දෙවන ලුතිතන් වර්ණකුලසූරිය අර්ජුන උදේශ් - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;

(ට) දෙවන ලුතිතන් අව්වාහන්දි තුසිත අමරතුංග ද සිල්වා - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;

(ඩ) දෙවන ලුතිතන් රසික රන්දෙණිය - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය ;

(ණ) දෙවන ලුතිතන් රාජපක්ෂ සේනාධීර ආරච්චිගේ ජීවනී පබසරා රාජපක්ෂ - ශ්‍රී ලංකා කාන්තා බලකාය ;

(ත) දෙවන ලුතිතන් ලත්තුවාහන්දි නදීක නුවන් ද සිල්වා - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;

(ද) දෙවන ලුතිතන් සම්මන්දප්පෙරුම මොහට්ටි අප්පුහාමිලාගේ දොන් චන්න මාතංග සම්මන්දප්පෙරුම - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(න) දෙවන ලුතිතන් පිටකෝට්ටේ මෙරිඤ්ඤගේ සුධීරා දේවිනී පෙරේරා - ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය ;

(ප) දෙවන ලුතිතන් ගමආරච්චිගේ ආනන්ද ප්‍රියාන් චානක දමයන්ත ගමආරච්චි - යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ;

(බ) දෙවන ලුතිතන් ලොකු ලියනගේ චරිත් සුදර්ශන කබ්රාල් - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය ;

(ම) දෙවන ලුතිතන් මල්ලදුර ගෙදර දමිත් චමින්ද සිකුරාජපති - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික බලකාය ;

(ය) දෙවන ලුතිතන් වන්නිනායක මුදියන්සේලාගේ දූලංග වන්නිනායක - ශ්‍රී ලංකා පොලිස් හේවා බලකාය ;

(ර) දෙවන ලුතිතන් පූජාගොඩ ගෙදර මහේෂ් අසේල කුමාර ගුණසේන - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය ;

(ල) දෙවන ලුතිතන් වැලිවිට වත්තේ වලව්වේ වික්‍රමසිංහ තිලකරත්න වාසල කුලංතුං මුදියන්සේ රාලහාමිලාගේ නුවන් ධනුෂ්ක බණ්ඩාර වැලිවිට - ශ්‍රී ලංකා සංඥා බලකාය ;

(ව) දෙවන ලුතිතන් සචේතන වික්‍රමරත්න සිරිවර්ධන - ශ්‍රී ලංකා පාබල හමුදාව ;

(ස) දෙවන ලුතිතන් ජයමාන්න මොහොට්ටිගේ දොන් කැලුම් මධුචන්ද්‍ර - ශ්‍රී ලංකා සංඥා බලකාය ;

(හ) දෙවන ලුතිතන් හිප්පල මහගෙදර උදය ෂමින්ද කුමාර ඉලංගරත්න - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

01-721

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/39/2012/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.01.25 වැනි දින සිට 2013.02.08 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්‍ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.02.15 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*උපලේඛනය*

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| හලාවත දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී දරන කොට්ඨාසයේ 141 වෙළුමේ 298 පත්ඉරුව. | වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ ඕතර පත්තුවේ පිටිගල් කෝරළයේ පිටාගාර පිහිටි "ලුණුමිදෙල්ලගහවත්ත, කැටකෑලගහවත්ත සහ කැටකෑලගහහේන" නැමති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක එෆ් දරන කැබැල්ලට ඩබ්. ඩී. ජේම්ස් බලයලත් මානකතැන විසින් 1960.04.09 දින මැන සාදන ලද අංක 731 පිඹුර ප්‍රකාර මායිම්,<br>උතුරට : එකී සිතියමේ සඳහන් සී අක්ෂරය දරන මෙම ඉඩමේ කොටස සහ එකී සිතියමේ සඳහන් අඩි අටක් පළලින් යුත් පාරකට ඇර තිබෙන මෙම ඉඩමේ ජී අක්ෂරය දරන කොටස ද,<br>නැගෙනහිරට : අංක 123797 සහ 123759ත් දරන සිතියම් වල සඳහන් ආර්. අයි. ප්‍රනාන්දුපුල්ලේට අයිති ඉඩම ද,<br>දකුණට : එකී සිතියමේ අයි අක්ෂරය දරන මෙම ඉඩමේ කොටස ද,<br>බස්නාහිරට : පාරකට ඇර තිබෙන අඩි අටක් පළලින් යුත් එකී සිතියමේ ජී අක්ෂරය දරන මෙම ඉඩමේ කොටස ද,<br>ප්‍රමාණය : අක්. 01, රූ. 01, පර්. 34 1/2 | 01. එම්. එෆ්. ඩබ්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1960.04.30 දින අංක 127 දරන විකුණුම්කරය.<br>02. එච්. පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1975.10.18 දින අංක 3396 දරන තෑගි ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

01-767

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත**

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමය.

ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය (වැ.බ.).

2012 උඳුවප් මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියමය

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධිත) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ වූ ද 1931 දෙසැම්බර් මස 04 වැනි දින අංක 7896 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව කලින් කල සංශෝධනය කරන ලද්දාවූද, ප්‍රකාශනයෙහි උපලේඛනයට මෙහි උපලේඛනයෙහි විස්තර කොට ඇති සිද්ධස්ථානය ඇතුළත් කිරීමෙන්, ඒ ප්‍රකාශය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපොල ඕතොට බස්නාහිර කෝරලේ පොල්ගහවෙල උඩපොල පිහිටි උඩපොල ශ්‍රී සපුමල් බණ්ඩාර දේවාලය.

01-672

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01, සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එෆ්. එම්. රෆීක් සහ එස්. ඩී. නසීහා නොහොත් එස්. ඩී. නසීහා.
ගිණුම් අංකය : 0099 5000 2104.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2012.11.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2008 අගෝස්තු මස 25 වැනි දාතම හා අංක 2043 දරන, 2009 ජනවාරි මස 28 දාතම හා අංක 2239 දරන, 2009 ජූලි 14 දාතම හා අංක 2363 දරන, 2010 ජනවාරි 19 දාතම හා අංක 2498 දරන හා 2010 නොවැම්බර් මස 16 දාතම හා අංක 2782 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ෆරීඩ් මොහොමඩ් රෆීක් සහ සේව් ඩාවුඩ් නසීහා නොහොත් සේගු ඩාවුඩ් නසීහා යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2043, 2239, 2363, 2498 සහ 2782 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හතලිස් එක්ලක්ෂ හතලිස්නම දහස් තුන්සිය හැටහයක (රු. 41,49,366) මුදලක් 2012 ඔක්තෝබර් මස 31 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් එක් ලක්ෂ හතලිස් නම දහස් තුන්සිය හැට හයක (රු. 41,49,366) මුදල ද, 2012 නොවැම්බර් මස 01 වැනි දින සිට අංක 2043, 2239, 2363, 2498 සහ 2782 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත්ලක්ෂ විසිදහස් හයසිය අනූහයයි ශත හැත්තෑ හතක (රු. 720,696.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයක් (19%) හා තවත් රුපියල් තිස් තුන් ලක්ෂ තිස් දහසක (රු. 33,30,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහක් (5%+at the rate of Average Weighted Deposit Rate) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2043, 2239, 2363, 2498 සහ 2782 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ මැද්දේකැටිය කෝරළේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හොරොම්බාව ග්‍රාමයේ පිහිටි "මාරගහකුඹුරේ වත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඒ. එන්. ගුණසිරි යන අය විසින් සාදන ලද (වඩා නිවැරදිව) 2005 නොවැම්බර් මස 10 දාතම හා අංක 4518 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කරුණාරත්න සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම වෙන් කරන සිමෙන්ති තාප්පය, නැගෙනහිරට : අජීස් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම වෙන් කරන සිමෙන්ති තාප්පය සහ එම පිඹුරේ ලොට්

1B, දකුණට : කුලියාපිටිය-කුරුණෑගල ප්‍රධාන පාර සහ සිමෙන්ති තාප්පය නමුත් වඩා නිවැරදිව එම පිඹුරේ ලොට් 1B, කුලියාපිටිය-කුරුණෑගල ප්‍රධාන පාර සහ සිමෙන්ති තාප්පය සහ බස්නාහිරට : සිමෙන්ති තාප්පය සහ එම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසි එකයි දශම තුනයි තුනක් (අ. 0, රූ. 1, පර්. 21.33) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4518 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව M134/219 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී හොරොම්බාව ග්‍රාමයේ පිහිටි "මාරගහකුඹුරේ වත්ත" යැයි කියනු ලබන ඉඩමට එකී අංක 4518 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ ලොට් 1A, නැගෙනහිරට : අසීස් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම වෙන් කරන සිමෙන්ති තාප්පය, දකුණට : කුලියාපිටිය-කුරුණෑගල ප්‍රධාන පාර සහ බස්නාහිරට : එම පිඹුරේ ලොට් 1A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් එකයි දශම එකයි හතක් (අ. 0, රූ. 0 පර්. 31.17) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4518 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව M 134/220 යටතේ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-766

---

**සීමාසහිත සෙලාන් බැංකුව - දෙහිවල ශාඛාව**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය**

ගිණුම් අංකය : 0140- 210558 -001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මාර්තු 05 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1998 සැප්තැම්බර් මස 01 දිනැති අංක 1271 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙහිවල ලියාපදිංචි අංක ඩබ්ලිව් 53882 එල් දරන ක්ලැසික් පැෂන්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන අබ්දුල් මජීඩ් මොහමඩ් නිසාම් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් නව ලක්ෂ හැත්තෑහයදහස් අටසිය දෙකයි ශත අසූ අටක (රු. 9,76,802.88) මුදලක් 2006 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 9,76,802.88 මුදල ද, 2006 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1271 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්කිස්ස පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඕ. පී. විජේසිංහ විසින් සාදන ලද 1979 පෙබරවාරි මස 05 දිනැති අංක 1298 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක 2බී ලකුණු කළ ගල්කිස්ස බාන්ස් ඇවනියු වරිපනම් අංක 12/3 (කොටසක්) දරන ගොඩනැගිලි සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : 2 ඒ කැබැල්ල ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1949 සැප්තැම්බර් මස 02 දිනැති අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 8), දකුණට : බාන්සු ඇවනියු වරිපනම් අංක 12/2 දරන දේපළ (අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3) ද සහ බස්නාහිරට : ද සේරම් පාර වරිපනම් අංක 17/3 දරන දේපළ සහ බාන්ස් ඇවනියු අංක 16, අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 ද, යන මායිම් තුළ එකී අංක 1298 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි පහක් (අ. 0 රූ. 0 පර්. 10.55) විශාල ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1424/201 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමගː-

පෙර කී ගල්කිස්ස බාන්ස් ඇවනියු පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1949 සැප්තැම්බර් මස 02 දිනැති අංක 413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබැලි අංක 8 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 (බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1950.02.01 දිනැති අංක 444 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 10) ද, නැගෙනහිරට : එකී අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 7, 6 සහ 5 ද, දකුණට : බාන්සු ඇවනියු සහ බස්නාහිරට : එකී අංක 413 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 2, 3 සහ 4 ද, යන මායිම් තුළ එකී අංක 413 දරන සැලැස්ම අනුව පර්චස් දොළහක් (අ. 0 රූ. 0 පර්. 12) විශාල, ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 916/38 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම,
ප්‍රධාන කළමනාකරු - නීති.

01-642

**සෙලාන් බැංකුව පීඑල්සී**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ශාඛාව :සංවර්ධන බැංකු ව්‍යාපාර ඒකකය (ඩෙවලප්මන්ට් බෑන්කිං යුනිට්).
ගිණුම් අංකය : 0270- 30329509-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.09.17 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එල්. පී. ද සිල්වා විසින් සහතික කරන ලද 2008 ජනවාරි මස 03 දිනැති අංක 36 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 05 පදිංචි කැමිලා ලුසන්ති ජෝර්ජෙන්සන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑදෙලක්ෂ අසූනවදහස් නවසිය පනස් අටයි ශත අනූනවයක (රු. 72,89,958.99) මුදලක් 2012 ජූලි 03 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 72,89,958.99 මුදල ද, 2012 ජූලි 04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි එකක් (21%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 36 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ , අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ කඳාන උප කාර්යාල සීමාව තුළ දකුණු බටගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2003.03.21 වැනි දිනැති අංක 2069 දරන සැලැස්මේ නිරූපනය වන ද මැසනඩ් විද්‍යාලය පාර, වරිපනම් අංක 1103 (කොටසක්) දරන මිල්ලගහවත්ත හෙවත් පතන්ගිගහවත්ත නමැති ඉඩමේ ලොට් පී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ටිරෝන් ගේ ඉඩම ද, නැගෙනහිරට : අඩි 10ක් පළල පාර ද, දකුණට : ලොට් ඒ හි ඉතිරි කොටස සහ බස්නාහිරට : පී. ඩී. දමියානුගේ ලොට් 1 ද, යන මායිම් තුළ එකී අංක 2069 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 9.50) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව බී 613/21 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත් කුරු කෝරළේ රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ කඳාන උප කාර්යාල සභා සීමාව තුළ දකුණු බටගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1976.08.05 දිනැති අංක 3772 දරන සැලැස්මේ නිරූපනය වන මිල්ලගහවත්ත හෙවත් පතන්ගිගහවත්ත නමැති ඉඩමේ ලොට් 7 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 6 ද, දකුණට : එල්. ඒ. සී. කුරුප්පු ගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 4 (අඩි පාර) ද යන මායිම් තුළ එකී අංක 3772 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව බී 621/94 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිණී - නීති.

01-641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.